නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය - හක්වටුනාඔය
வதிவிட திட்ட முகாமையாளர் காரியாலையம் –` க்வடுனாஓய
Resident Project Management Office – Hakwatunaoya


වාරිමාර්ග කළමනාකරණ අංශය
நீர்ப்பாசன முகமைத்துவ பிரிவு
Irrigation Management Division
වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය
நீர்ப்பாசனம் மற்றும் நீர் முகாமைத்துவ அமைச்சு
Ministry of Irrigation & Water Resources Management

එගොඩගම
මාඑළිය
எகொடகம
மாஎலிய
Egodagama
Maeliya


M o - 1
16 OCT 2017
වාරිමාර්ග කළමනාකරණ අංශය

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My Ref No — 9/3/12 | ඔබේ අංකය / உமது இல. / Your Ref No — | දිනය / திகதி / Date — 2017/9/21 |

1. ගොවි සංවිධාන නිලධාරීන්,
   නියෝජිත මහත්ම/ මහත්මීන්,
2. රාජ්‍ය අංශයේ හා ආයතන මට්ටමේ
   ආයතන ප්‍රධානීන්/ නිළධාරි මහත්ම මහත්මීන්,

**<u>2017/2018 මහ කන්නය සඳහා පෙර කන්න රැස්වීම/ ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම හක්වටුඔය ව්‍යාපාරය - 2017/09/21.</u>**

හක්වටුනාඔය මහා වාරි ව්‍යාපාරයේ 2017/2018 මහ කන්නය සඳහා පෙර කන්න රැස්වීම සහ 2017 සැප්තැම්බර් මහ ව්‍යාපාර කළමනාකරන කමිටු රැස්වීම 2017/09/21 වන දින නේවාසික ව්‍යාපාර කළමනාකරු ගේ ප්‍රධානත්වයෙන් හක්වටුනාඔය නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයීය රැස්වීම් ශාලාවේදී පවත්වන ලදී.

**01.** <u>සහභාගීත්වය</u>

1.1 විශේෂ ආරාධිතයින්

මෙදින රැස්වීමට විශේෂ ආරාධිත අමුත්තන් කිසිවකුත් සහභාගී නොවීය.

**1.2 නිරීක්ෂකයින්**

නිරීක්ෂක මහතුන් කිසිවකුත් සහභාගී නොවීය.

**1.3 සහභාගීත්වය:-**

**රාජ්‍ය නිලධාරී මහත්ම මහත්මීන්**

1. ඩබ්.එම්.ඩී ගාමිණී කුසුම් ශ්‍රියානන්ද- නේවාසික ව්‍යාපෘති කළමනාකරු
2. ඊ.එම්.යූ.ජයවර්ධන - ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී -රඹේ කලාපය
3. එම්.පී.ඩී.එස්.කේ. සෝමරත්න -කෘෂි උපදේශක
4. ජී.ආර් අයි.එස් ගමලත්-ඉංජිනේරු සහකාර - වාරිමාර්ග දෙපාර්තමේන්තුව
5. ඊ.එම්.ඩී.එන්.චන්ද්‍රතිලක - තාක්ෂණ සහකාර - - වාරිමාර්ග දෙපාර්තමේන්තුව
6. එස්.ඩී.එන්.ඒකනායක - සංවර්ධන නිළධාරී
7. එන්.ඩබ්.එන්.පී එන්.කුමාරි- සංවර්ධන නිළධාරී
8. අයි.ජී.එස් සිරිවර්ධන- සංවර්ධන නිළධාරී
9. එච්.එම්.ටී.කේ.වික්‍රමරත්න- සංවර්ධන නිළධාරී නිළධාරී

**<u>ගොවි සංවිධාන නියෝජිතයින්</u>**

1. ඩී.එම්.නිශාන්ත ජේමචන්ද්‍ර -ගරුසභාපති (ද.ඉ.යාය 7 ඇනිකට් ඇල ගොවි සංවිධානය )
2. ආර්.ඩී.එන්.රාජපක්ෂ- ගරු භාණ්ඩාගාරික (ද.ඉ.යාය 7 ඇනිකට් ඇල ගොවි සංවිධානය )
3. ආර්.එම්.තිලකරත්න බණ්ඩා-ගරු ලේකම් (ද.ඉ.යාය 7 ඇනිකට් ඇල ගොවි සංවිධානය )
4. එච්.එම මුදියන්සේ-ගරුසභාපති (ද.ඉ.යාය 06 ගොවි සංවිධානය)

5. ඊ.එම්ජයතිලක-ගරුසභාපති(ව.ඉ.ඩී 5කුලංකට්ටය අලුත්වැව ගොවි සංවිධානය)
6. ආර්.පී සිරිසේන -ගරුසභාපති (ව.ඉ.දෙමටගොල්ල බෙදුම්ඇල ගොවි සංවිධානය)
7. ජ්.එම්.ආර්.අතපත්තු-ගරු සභාපති (ද.ඉ.යාය 1-2 තලාකොළවැව බෙදුම්ඇල ගොවි සංවිධානය)
8. ඩබ්.එම්.විජිතසිරි -උප ලේකම් (ද.ඉ.යාය 1-2 තලාකොළවැව බෙදුම්ඇල ගොවි සංවිධානය)
9. ආර්.එම්.නවරත්න-උප සභාපති(ද.ඉ.යාය 1-2 තලාකොළවැව බෙදුම්ඇල ගොවි සංවිධානය)
10. ඊ.එම්.සිසිර කුමාර-ගරු ලේකම්(ද.ඉ.යාය 1-2 තලාකොළවැව බෙදුම්ඇල ගොවි සංවිධානය)
11. ආර්.ජ්.චන්ද්‍රසේකර- (ව.ඉ.ඩී 01 උඩයට පාලගම බෙදුම්ඇල ගොවි සංවිධානය)
12. ආර්.ජ්.වර්ණසූරිය-(ව.ඉ.ඩී 01 උඩයට පාලගම බෙදුම්ඇල ගොවි සංවිධානය)
13. ජ්.එම්.සමන්ති නිරෝෂා-(ව.ඉ.ඩී 01 උඩයට පාලගම බෙදුම්ඇල ගොවි සංවිධානය)
14. ආර්.ජ් ප්‍රේමරත්න-ගරුසභාපති (ව.ඉ.ඩී 01 උඩයට පාලගම බෙදුම්ඇල ගොවි සංවිධානය)
15. එච්.පී ජයසිංහ පතිරණ-ගරු සභාපති (ව.ඉ.යාය 4-5 ඩී 3 ආගාර කටුගම්පල බෙ.ගොවි සංවිධානය)
16. ටී.ඩී.හේමචන්ද්‍ර-ගරු භාණ්ඩාගාරික (ව.ඉ.ඩී 6 වඩුරුස්ස බෙ.ගොවි සංවිධානය)
17. ඩබ්.ආරියරත්න-ගරු ලේකම් (ව.ඉ.යාය 4-5 ඩී 3 ආගාර කටුගම්පල බෙ.ගොවි සංවිධානය)
18. බී.වික්‍රමසිංහ-ගරු ලේකම් (ව.ඉ.ඩී 07 දාගම බෙදුම්ඇල ගොවි සංවිධානය)
19. කේ.ඩී.පියදාස- ගරු භාණ්ඩාගාරික (ව.ඉ.ඩී 07 දාගම බෙදුම්ඇල ගොවි සංවිධානය)
20. ඊ.එම් විජේසූරිය ඒකනායක- ගරුසභාපති (ව.ඉ.ඩි 03 සිසිල් පොකුණ බෙදුම්ඇල ගොවි සංවිධානය)
21. එච්.එම්.පී.කුමාරි-ගරු භාණ්ඩාගාරික(ව.ඉ.ඩි 03 සිසිල් පොකුණ බෙදුම්ඇල ගොවි සංවිධානය)
22. ආර්.පී.සිරිසේන-ගරු සභාපති (ව.ඉ.දෙමටගොල්ල බෙදුම්ඇල ගොවි සංවිධානය )
23. ඩී.එම්.එස්.ජී.දිසානායක-ගරු භාණ්ඩාගාරික(ව.ඉ.දෙමටගොල්ල බෙදුම්ඇල ගොවි සංවිධානය )
24. ජ්.එම්.යු.කේ කරුණාරත්න -ගරු ලේකම් (ද.ඉ.යාය 3 ඩී 8 සියඹලාවැව බෙදුම්ඇල ගොවි සංවිධානය )
25. ආර්.එම්.දිසානායක-ගරු සභාපති (ද.ඉ.යාය 3 ඩී 8 සියඹලාවැව බෙදුම්ඇල ගොවි සංවිධානය )
26. ජේ.පී.ජ්.ආර්.එම්.ජයසූරිය -ගරු ලේකම් (ව.ඉ.දෙමටගොල්ල බෙදුම්ඇල ගොවි සංවිධානය )
27. ආර්.ඩී.ගුණතිලක - ගරුසභාපති (ව.ඉ.ඩී 4 ට්‍රැක් 7 තම්බුව බෙදුම් ඇල ගොවි සංවිධානය)
28. එස්.එම් ජයරත්න-ගරු භාණ්ඩාගාරික(ද.ඉ.යාය 3 ඩී 8 සියඹලාවැව බෙදුම්ඇල ගොවි සංවිධානය )
29. කේ.වී අමරතුංග-ගරු සභාපති (ව.ඉ.ඩී 6 වඩුරුස්ස බෙදුම්ඇල ගොවි සංවිධානය )

**02.** ප්‍රථමයෙන්ම ආගම සිහිකිරීමෙන් අනතුරුව නේවාසික ව්‍යාපාර කළමනාකාර මහතා විසින් රැස්වීමට සහභාගී වූ සියළුම රාජ්‍ය නිලධාරී මහත්ම මහත්මීන් සහ ගොවි සංවිධාන නියෝජිත මහත්ම මහත්මීන් පිළිගැනීම සහ රැස්වීමේ අරමුණ පැහැදිළි කිරීමෙන් අනතුරුව සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදී.

**03.පසුගිය වාර්තාව සභා සම්මත කිරීම.**

2017/08/04 දින පැවති 2017 අගෝස්තු මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාවේ අඩුපාඩු කිසිවක් නොවූයෙන් සභාවේ ඒකමතික තීරණයෙන් සභා සම්මත කරන ලදී.

**04.වැඩ සටහන් පිළිබඳ සාකච්ඡාව.**

**04.1.ආයතන සංවර්ධන කටයුතු**

ඉදිරිපත් කිරීම:- එච්.එම්.ටී.කේ.වික්‍රමරත්න - සංවර්ධන නිලධාරී

- වාරිමාර්ග කළමනාකරණ අංශය මගින් 2017 සිට හොඳම ගොවි සංවිධානය තේරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සලකාබලන නිර්ණායක ඉදිරිපත් කර ඇති බවත්, ඊට උනන්දු වී වැඩ කරන ගොවි සංවිධාන පහක් නම්කර යැවීමට කටයුතු කිරීමට නේවාසික ව්‍යාපාර කළමනාකරුට උපදෙස් ලැබී ඇති බවත්, කාරකසභා, මහසභා රැස්වීම් නිසි කලට වේලාවට පැවැත්වීම, ක්‍රමවත්ව පොත්පත් නඩත්තුව, නඩත්තු මෙහෙයුම් කටයුතු අවශ්‍ය වේලාවට සිදුකිරීම, පුහුණු වැඩසටහන්, ව්‍යාපාර කමිටු රැස්වීම්, ජලපාලක රැස්වීම් වැනි රැස්වීම්වලට අවශ්‍ය ගොවි නියෝජිතයින් සහභාගීවීම, මුදල් කටයුතු විනිවිධභාවයකින් යුතුව පවත්වාගෙන යාම වැනි ගොවි සංවිධානයක උන්නතිය උදෙසා බලපාන සියළුම කටයුතු ක්‍රමවත් නම් කුමණ ගොවි සංවිධානයකට වුවද මෙම තරඟයට ඉදිරිපත්වී ජයග්‍රහණය කර ගොවි සංවිධාන නියෝජිතයින්ට විදේශ සංචාරවලටත් සහභාගී වීමට අවස්ථාව ලැබෙන බවත් දන්වන ලදී.
- 2017 යල් අස්වනු පූජා වැඩසටහන 2017/09/30 සහ 2017/10/01 යන දින දෙක තුළ මහනුවර ශ්‍රී දළදා මාළිගාවේ කටයුතු හක්වටුනාඔය ව්‍යාපාරයේ ගොවි සංවිධානවලය භාරදී ඇති බවත්, ඊට ගොවි සංවිධානයකින් හතරදෙනෙකුවත් සහභාගී වියයුතු බවත්, පූජා වැඩසටහන් ගණනාවක් ම පැවැත්වීමට සියළුමදෙනාගේ අපකැපවීමෙන් සිදුකළයුතු බවත්, ඉදිරි සතියේ සෙනසුරාදා දින අවශ්‍ය භාණ්ඩ රැගෙන ගොවි පිරිසක් මහනුවර ශ්‍රී දළදා මාළිගාවට යා යුතු බවත්, ඉරිදා දින පෙරවරුවේ දී තවත් ගොවි පිරිසක් යා යුතු බවත්, පවසන ලදී. මෙම අස්වනු පූජා වැඩසටහනට පෙර කන්නවලදී නම්, පූජාකිරීමට අස්වනු තිබූ බවත්, පිළිවෙලටම කන්න දෙකක් වගා නොකළ ගොවීන් වන හක්වටුනාඔය ගොවීන්ට රැගෙන යාමට අස්වැන්නක් නොමැති බැවින් එක ගොවි සංවිධානයකින් රුපියල් පන්සියය බැගින් ආධාර මුදලක් රැස්කරන බවත්, එය අද දින රැස්වීමට පැමිණෙනවිට දී කාර්යාලයට භාරදීමට කටයුතු කරන ලෙස ගොවි නියෝජිත මහත්ම මහතමීන්ට පෙර දැනුවත් කිරීමක් සිදුකරන ලද බවත්, ඊට අමතරව නෙළුම් මල් 300 ක්, පූජාවට එකතු කරන මිටි සහලින් පිසින කිරිබත සඳහා සුදු රෙදිකඩකින් ඔතන ලද මිටි සහල් එකසිය අට බැගින් වූ පසුම්බි සහ වෙනත් ඔනැම පූජා භාණ්ඩයක් මෙම පූජාවට පූජාකිරීමට අවස්ථාව ඇති බවත්, දන්වන ලදී.

  ඉදිරිපත් කිරීම :- නේවාසික ව්‍යාපාර කළමනාකරු

- ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානයේ නිලවරණ මහසභා රැස්වීම 2017/09/17 දින මහා වාරි ව්‍යාපාරවල ඒකාබද්ධ ගොවිසංවිධානවල නියෝජිත මහත්ම මහත්මීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වූ බවත්, එයට මෙම ව්‍යාපාරයෙන් සහභාගී වූ කුරුණෑගල දිස්ත්‍රික් ඒකාබදධ ගොවි සංවිධානයේ ගරු ලේකම්, හක්වටුනාඔය ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති, දකුණු ඉවුර යාය 3 ඩී 8 සියඹලාවැව බෙදුම්ඇල ගොවි

සංවිධානයේ ශරු සභාපති වූ ආර්. එම්. දිසානායක මහතා, ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානයේ මාධ්‍ය ප්‍රචාරක ලේකම් ධුරයට තෝරා පත්කරගැනීම හක්වටුනාඔය ගොවි ජනතාවම ලැබූ විශිෂ්ට ජයග්‍රහනයක් බවත්, එතුමන්ට සුභපතන බවත් පවසන ලදී.

## 05. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ඉදිරිපත් කිරීම :- එම්.පී.ඩී.එස්.කේ.සෝමරත්න - කෘෂිකර්ම උපදේශක

- 2017 යල කන්නයේ දී සෝයාබෝංචි වගාව මෙම ව්‍යාපාරයේ ප්‍රචලිත කිරීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සහ කෘෂිකර්මාන්තයට අදාල ආයතන වල නිලධාරී මහත්ම මහත්මීන් උනන්දු වී භෝග ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ගණනාවක් පැවැත්වූ බවත්, ඒවායේ ප්‍රතිඵලයක් ලෙස ගොවි සංවිධාන හතරක මෙම භෝගය වගාකිරීම සිදුකළ බවත්, දැනට අස්වන්න නෙළිමේ කටයුතු සිදුවන බවත්, සෝයා බෝංචි අක්කර විස්සක් පමණ නියඟයෙන් බේරාගැනීමට හැකිවූ බවත්, මෙම ව්‍යාපාරයේ විවිධ තැන්වලදී තමාගේ නිරීක්ෂණයට ලක්වූ සෝයාබෝංචි වගාවන්ගේ ඡායාරූප මේ වනවිට තිරයේ නරඹන්නට අවස්ථාව ලබාදී ඇති බවත් පවසන ලදී.
- පිළිවෙලට කන්න දෙකක් වී වගාව සිදුකිරීමට අවකාශය නොලැබීම හේතුවෙන් ව්‍යාපාරයේ ගොවීන්ට ඉදිරි 2017/2018 මහ කන්නයට බිත්තර වී බාහිරින් ලබාගැනීමට සිදුව ඇති බවත්, නිවැරදිව බිත්තර වී අවශ්‍යතාවය අක්කර ප්‍රමාණය සහ අවශ්‍ය කරන දිනය පිළිබඳව දැනුම් දීම ක්‍රමවත්ව ගොවි සංවිධාන නිලධාරීන් විසින් සිදුකරන්නේ නම්, එම අවශ්‍යතාවය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සපුරාදිය හැකි බවත් පවසන ලදී.
- බිත්තර වී හිඟයට පිළියම් ලෙසට අවම බිත්තර වී ප්‍රමාණයකින් වැඩි කුඹුරු අක්කර ප්‍රමාණයක් වගාව සිදුකිරීමට හැකි වගාක්‍රම භාවිතය සිදුකළයුතු බවත්, පෙර කන්න වලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් 50% දායකත්වයෙන් ලබාදී ඇති පැළ විසුරුම් වගාතැටි සහ ගොවීන් විසින් මිලදී ගෙන ඇති ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍ර භාවිතා කිරීම බෙහෙවින් උපකාරී වන බව පවසන ලදී. පැළ විසුරුම් තැටි භාවිතයේදී අකකරයක් සඳහා බිත්තර වී කිලෝග්‍රෑම් 10ක් අවශ්‍ය වන බවත්, ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍රය භාවිතයේදී අක්කරයක් සඳහා බිත්තර වී කිලෝග්‍රෑම් 12ක් පමණ ප්‍රමාණවත් වන බවත්, පවසන ලදී. පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ගොයම් පැළ සිටුවීමේ යන්ත්‍ර හතක් පමණ මේ වනවාට ගොවීන් අතරින් මිලදී ගත් පුද්ගලයන් සිටින බවත්, කේ.ඩී.ප්‍රේමදාස - මාළුළිය, ලංකාතිලක - ගල්ටැංවැව, ඒ.එම්.ආනන්ද - තලාකොළවැව, ඔවුන් අතරින් තිදෙනෙකු වන බවත්, බෝගොල්ල සහ ඇනිකට්ඇල වසම්වල ද මෙම යන්ත්‍ර මිලදී ගත් පුද්ගලයන් සිටින බවත්, කුමණ ගොවියාට වුවත්

යන්ත්‍රයෙන් ගොයම්පැළ සිටුවාගැනීමට අවශ්‍ය නම් තමාව දැනුවත් කිරීමෙන් යන්ත්‍ර හිමියෙක්ව සම්බන්ධ කරගැනීමට අවස්ථාව ඇති බවත් දන්වන ලදී.

❖ 2017/2018 මහ කන්නයට මෙම ව්‍යාපාරයේ ගොවීන් අතරින් බහුතරයක්ම වී වගාවට මනාප වන් බවත්, වර්ෂාව උපරිම ලෙස ප්‍රයෝජනයට ගෙන ඉතා ඉක්මනින්ම කන්නය පටන්ගතයුතු බවත්, ඔක්තෝබර් 15න් පසු මහ කන්නයක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිළිගන්නා බවත්, අස්වැන්න නෙළීමට ගත්වන කාලය මාස හතරක් ගතවන වී වර්ගයක් නම්, ඔක්තොම්බර් 15 වනවිට වගාව පිහිටුවා අවසන් කළහොත්පෙබරවාරි 15 වනවිට අස්වැන්න නෙළිය හැකි බවත්, මාස තුන හමාර වී වර්ගයක් නම් ඔක්තොම්බර් 30 වනවිට වගාව පිහිටුවා අවසන් කළහොත් පෙබරවාරි 15 වනවිට අස්වැන්න නෙළිය හැකි බවත්, මාස තුන වී වර්ගයක් නම් නොවැම්බර් 15 වනවිට වගාව පිහිටුවා අවසන් කළහොත් පෙබරවාරි 15 වනවිට අස්වැන්න නෙළිය හැකි බවත්, වර්ෂාවත් සමග ම කැකුළමට ක්ෂේත්‍රය සකස් කර වගාවට අවතීරණය වීමෙන් කන්නය සාර්ථක කරගතහැකි බවත් දන්වන ලදී.

<u>06. ගොවිජනසේවා දෙපාර්තමේන්තුව</u>

ඉදිරිපත් කිරීම:- ගොවිජන සේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරි

- පොහොර චක්‍රලේඛනය පිළිබඳව පොහොර ලේකම් කාර්යාලයේ නියෝජිත මහතුන් පැමිණ ගොවි සංවිධාන නියෝජිත මහත්ම මහත්මීන් සහ අදාල අංශවල නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2017/09/20 දින පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී පැවැත්වූ බවත්, ඉදිරි මහ කන්නයේදීත් කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක අධ්‍යයන අංශය හා ඒකාබද්ධව පොහොර සහනාධාරය හිමිවන ගොවීන්ගේ දත්ත ගබඩාව යථාවත් කිරීම සිදුකරන බවත්, එම වැඩසටහනට අලුතෙන්ම ඇතුළත්වන ගොවීන්ට පමණක් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මහත්ම මහත්මීන් මුණගැසී අදාල ලියාපදිංචි වීමේ අයදුමපත් පිරවීමට සිදුවන බවත්, මීට පෙර කන්නවලදී පොහොර සහනාධාරය ලබාගත් ගොවීන්ගේ තොරතුරු සංශෝධන කළයුතු තැන් පමණක් අදාල කටයුතු සිදුකිරීමත්, අනෙකුත් තොරතුරු යථාවත් කිරීමක් සිදුකිරීමටත් බලාපොරොත්තු වන බව දන්වන ලදී. කුඹුරු ඉඩම්වල වෙනත් බෝග වගාකරන ගොවීන්ටද මෙම සහනාධාරය හිමිවන බවත්, මෙවර පොහොර සහනාධාරය ලබාදීම එක් පවුලකට උපරිම අක්කර පහක් දක්වා වන බවත්, කන්නයකට රුපියල් විසිපන්දහසක ප්‍රමාණය වන බවත් පවසන ලදී.
- 2016/2017 මහ කන්නයේ වගාහානි සඳහා වන්දි මුදල් මේ වනවිට අදාල ගොවීන්ගේ බැංකු ගිණුම්වලට එකතුකර ඇති බවත්, රඹේ කලාපයේ වගා වන්දි ඉල්ලුම් කළ ගණන 8 699 ක් බවත්, අලුතෙන් එම කන්නයට වගා වන්දි සඳහා ගොවීන්ගේ නම් ඇතුළත් කිරීමක්

සිදුකිරීමට නොහැකි බවත්, පවසන ලදී. 2017 යල කන්නයේ දී සිදුවී ඇති වගාහානි සම්බන්ධව අදාල තොරතුරු මේ වනවිට රැස්කර ඇති බවත්, අදාල කටයුතු සඳහා ප්‍රධාන කාර්යාලයෙන් ඉල්ලුම්කළ සැනින් එම තොරතුරු ලබාදිය හැකි බවත්, ඉදිරි කටයුතු වලට තවම ප්‍රාදේශීය ගොවිජනසේවා මධ්‍යස්ථානවලට උපදෙස් ලැබී නොමැති බවත් දන්වන ලදී.

- කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් වලට අදාලව කාන්තා ගොවිසංවිධාන පිහිටුවා ඇති බවත්, ඉන් ගොවි සංවිධාන විස්සක් ගොවිජන සංවර්ධන පනතේ දැනට ගොවි සංවිධාන ලෙසට ලියාපදිංචි කරඇති බවත්, තවත් සංවිධාන විසිපහක් ලියාපදිංචියට යොමුකර ඇති බවත්, හොඳම ගොවි සංවිධානය තේරීමේ තරඟයක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් සිදුකරන බවත්, එයට මෙම කාන්තා ගොවිසංවිධානවල සාමාජික මහත්මීන්ට තම ගෙවතු ඉදිරිපත් කළහැකි බවත්, ඊට උනන්දු වන ලෙසත් දැනුම් දෙනලදී.
- ඉදිරි මහ කන්නයට බිත්තර වී සපයාගැනීම තරමක් දුෂ්කර කාර්යයක් වුවත් තම දෙපාර්තමේන්තුවට කල් පමාවකින් තොරව අවශ්‍යතාවය දැනුම්දෙන්නේ නම්, යම් බිත්තර වී ප්‍රමාණයක් සපයාදීමේ හැකියාවක් පවතින බවත්, පවසන ලදී.
- හක්වටුනාඔය මහා වාරි ව්‍යාපාරයේ සම්පූර්ණ වගාබිම් ප්‍රමාණය අක්කර 6 371 ක් ලෙස අදාල ලිපිලේඛනවල සටහන්ව තිබුණත්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මහත්ම මහත්මීන්ගේ ලේඛන වලට අනුව එම ප්‍රමාණය අඩුවන බවත්, 2005 වර්ෂයේ සිටම පොහොර ලේඛන නිරීක්ෂණය කර ලබාගත් තොරතුරු අනුව එම කිසිඳු කන්නයකදී හක්වටුනාඔය මහා වාරි ව්‍යාපාරයේ කුඹුරු අක්කර 6 371කට පොහොර ලබාගෙන නොමැති බවත්, නිවැරදිවම ගණන් බලා මෙම වගාබිම් ප්‍රමාණය නිශ්චිතවම නිවැරදිව සටහන් කරගත යුතු බවත්, ඊට ගොවි සංවිධාන නියෝජිත මහත්ම මහත්මීන්ගේ මෙන්ම අදාල ආයතනවල ක්ෂේත්‍ර නිලධාරීන්ගේ අවධානය යොමුකර කටයුතු සිදුකරන ලෙස ඉල්ලීමක් සිදුකරන ලදී.

<u>07. වාරිමාර්ග දෙපාර්තමේන්තුව.</u>

ඉදිරිපත් කිරීම - ඉංජිනේරු සහකාර - ජී.ආර්.අයි.එස්.ගම්ලත්

අද දිනය වනවිට ප්‍රධාන ජලාශයේ ජල මට්ටම අඩි 13 අඟල් 6 ක් එනම් අක්කර අඩි 8 595ක් මට්ටමේ පවතින බවත්, ජලාශයේ මළධාරිතාවය ඉවත්කළවිට අක්කර අඩි 5 553 ක් ප්‍රයෝජනයට ගතහැකිවන බවත්, දැනට පවතින ජල පරිමාවට සාපේක්ෂව වගා නිර්දේශ වගා බිම් ප්‍රමාණය අක්කර 1 100ක් වන බවත් පවසන ලදී. පෙර වසරවල වර්ෂාපතන දත්ත අනුව ඔක්තෝබර් මස මැද සතියේ සිට වර්ෂාව බලාපොරොත්තු වියහැකි බවත්, වගා කන්න දෙකක්ම නියං කාලගුණය හේතුවෙන් වගාව අත්හැර තිබූ ව්‍යාපාරයක් විදිහට

මනාව සිතීමෙන් සහ සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගතහැකි හොඳම වගාතීරණය ගන්නා ලෙස දැනුම්දෙන ලදී.

| අදාල කන්නය | මාසය | පතිත වූ වර්ෂාපතනය |
|---|---|---|
| 2010/2011 මහ කන්නය | ඔක්තෝබර්<br>නොවැම්බර් 4-5 | වර්ෂාව ලැබී නැත<br>වර්ෂාව ලැබී ඇත |
| 2014/2015 මහ කන්නය | ඔක්තෝබර් 17<br>නොවැම්බර් | මිලිමීටර් 124<br>කඩින් කඩ සුළු වැහි |
| 2015/2016 මහ කන්නය | ඔක්තෝබර් 18-20<br>නොවැම්බර් | කඩින් කඩ සුළු වැහි<br>මිලිමීටර් 387 |
| 2016/2017 මහ කන්නය | ඔක්තෝබර් 16<br>නොවැම්බර් | මිලිමීටර් 165<br>කඩින් කඩ සුළු වැහි |

## 08. ගොවි සංවිධාන ගැටළු සහ යෝජනා ඉදිරිපත් කිරීම.

| ඉදිරිපත් කළ අය | ගැටළුව/ විමසීම | විසඳුම/අදහස් දැක්වීම |
|---|---|---|
| ද.ඉ.යාය 7 ඇනිකට්ඇල බෙ.ගොවි සං.-ගරු සභාපති | • 2016/2017 මහ කන්නයේ වගා නොකළ ඉඩම් සඳහා වගා වන්දිය පිළිබඳව ගොවීන් නිතරම විමසන බවත්,<br>• 2015 වසරේදී ගොවි හැඳුනුම්පතක් ලබාදෙන බව පවසා කෘ.ප.නි.සහකාර මහතාට ගොවීන්ගෙන් අයකර රු.37 000.00 ක් එකතුකර ලබාදුන් බවත්,ගොවිජන බැංකු සාමාජිකත්වයට එක් ගොවියෙකුගෙන් රු.100.00 ක් අයකළ බවත්, මේ මුදල් වලට බිල්පත් නිකුත් කර නොමැති බවත් දන්වන ලදී.<br>• CR!P ව්‍යාපෘතියට ඇතුලත් නොවී ඇති නඩත්තු කළයුතු වැඩ පිළිබඳ ඇස්තමේන්තුවට ඇතුළත් කරගන්නේ කෙසේදැයි විමසන ලදී. | ගොවිජනසේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරී - එම කන්නයේ වගා වන්දි පිළිබඳව තවම විසඳුමක් නෑ. කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මහතා බිල්පත් නිකුත් නොකර අයකර ඇති මුදල් සම්බන්ධව ලිඛිතව දැනුම්දෙන ලෙසත් දන්වන ලදී.<br><br>ඉංජිනේරු සහකාරතුමිය- සංජය නම් නිලධාරියාට දන්වා ඇස්තමේන්තුවට ඇතුළත් කරගතහැකි බව දන්වන ලදී. |
| ද.ඉ.යාය 6 බෙ.ගොවි සං.-ගරු සභාපති | 2015 වසරේදී ගොවි හැඳුනුම්පතක් ලබාදෙන බව පවසා කෘ.ප.නි.සහකාර රූපසිංහ මහතාට ගොවීන්ගෙන් අයකර රු.65 000.00 ක් එකතුකර ලබාදුන් බවත්, ගොවිජන බැංකු සාමාජිකත්වයට එක් | ගොවිජනසේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරී - කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මහතා බිල්පත් නිකුත් නොකර අයකර ඇති මුදල් සම්බන්ධව ලිඛිතව දැනුම්දෙන ලෙස දන්වන ලදී. |

| | | |
|---|---|---|
| | ගොවියෙකුගෙන් රු.100.00 ක් අයකළ බවත්, මේ මුදල් වලට බිල්පත් නිකුත් කර නොමැති බවත් දන්වන ලදී. | |
| ව.ඉ.ඩී 3 සිසිල් පොකුණ බෙ.ගොවි.සං-ගරු සභාපති | • පැළ විසුරුම් තාක්ෂණයට වගා තැටි 50% දායකත්වයට මෙම කන්නයේදීත් ගොවීන්ට ලබාගත හැකිද යන්න සහ පැළ සිටුවන යන්ත්‍ර මිලට ගන්නේනම්, රජයේ රු. 100 000.00 ක දායකත්වය තිබෙනවාද යන්න විමසන ලදී.<br>• ගලහ ප්‍රදේශයේ පිහිටුවා ඇති කෘෂිකර්ම කාර්යාලයේදී 2017/08/27 වන දින පැවති රැස්වීමේදී කෘෂිකර්ම ඇමති තුමාගේ ලේකම් තුමා වගා වන්දි ඉල්ලුම්කිරීමට තවත් අදියරක් ක්‍රියාත්මක වන බව දැනුම්දුන් බව පවසන ලද බවත්, අදාල නිලධාරීන් ඒ පිළිබඳව දැනුවත් නැත්ද යන්නත් විමසන ලදී. . | • කෘෂිකර්ම උපදේශක - වගාතැටි වැඩිම ප්‍රමාණයක් ලබාදී ඇති කලාපය පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වන බැවින් වගාතැටි ලබාදීම පිළිබඳව පොරොන්දු විය නොහැකි බවත්, යන්ත්‍ර මිලදී ගන්නා පුද්ගලයන් වේ නම් රජයේ දායකත්වය තිබෙන බවත් පවසන ලදී.<br>• ගොවිජනසේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරීතුමා-වගා වන්දි පිළිබඳව දැනුවත් කළ වහාම අප කාර්ය මණ්ඩලය ක්‍රියාත්මක වන බව දන්වන ලදී. |
| ව.ඉ.යාය 4-5 ඩී 3 අගාර කටුගම්පල බෙ.ගොවි සං.-ගරු සභාපති | • ගොඩබෝග වගාව සහ වී වගාව සිදුකරන ගොවියෙකුට පොහොර සහනාධාරය ලබාගන්නා ආකාරය විමසන ලදී. | ගොවිජනසේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරීතුමා-එම තොරතුරු කෘ.ප.නි.සහකාර නිලධාරීතුමාට දැනුම්දුන් පසු එතුමා අදාල කටයුතු සිදුකරන බව දන්වන ලදි.එකම පුද්ගලයාට කුඹුරට සහ ගොඩබෝග වලට පොහොර සහනාධාරය ලබාගත හැකියි. |
| ව.ඉ.ඩී 6 වදුරස්ස බෙ.ගොවි සං.-ගරු සභාපති | අලුතෙන් කපනලද ඇලෙන් එක ගොවියෙකුට මීටර් 50ක් පමණ දුර ජලය ලබාගත නොහැකි බව දන්වන ලදී. | ඉංජිනේරු සහකාරතුමිය-අදාල ස්ථානය පරීක්ෂා කරබලා ගතහැකි සුදුසු විසඳුමක් ලබාදෙන බව දන්වන ලදී. |
| ව.ඉ.ඩී 7 දාගම බෙ.ගොවි සං.-ගරු භාණ්ඩාගාරික | • බිත්තර වී අවශ්‍යතාවය කඩිනමින්ම දැනුම්දිය හැකි වුවත්, වී ගෙන්වූ විට මිලට ගන්න ගොවීන් ඉදිරිපත් නොවූවහොත් ගැටළුවක් ඇතිවන බව දන්වන ලදී<br>• දාගම වැවක පස් ඉවත් කිරීමක් සිදුකරන බවත්, එම පොහොර පස් කුඹුරුවලට යෙදීමට අවසර අවශ්‍යකරන බවත් දන්වන ලදී. | කෘෂිකර්ම උපදේශක-බිත්තර වී රැගෙන එන්නට පෙර ගොවීන්ගෙන් මුදල් අයකරගැනීම සිදුකරන ලෙස දන්වන ලදී.<br><br>ගොවිජනසේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරීතුමා-කුඹුරු ඉඩමකට පස් පිරවීමට නියෝජ්‍ය ගොවිජනසේවා කොමසාරිස්තුමියට දන්වා අවසරය ලබාගෙන සිදුකළ හැකි බව දන්වන ලදී. |
| ද.ඉ.යාය 1-2 තලාකොළවැව බෙ.ගොවි සං.-ගරු සභාපති | • 2017 යල කන්නයේ D0-D5 වගාකටයුතු සිදුකර තිබුණද තව වෙනතුරුත් පොහොර සහනාධාර මුදල ලැබී නොමැති බව දන්වන ලදී.<br>• නිර්මිත ඉදිකරඇති ඒවාට පස් පිරවීමට JCB යන්ත්‍රය අවශ්‍ය කරන බවත්, ඉල්ලුම් කර තිබූ කුඹුරු බට 14 වෙනුවට බට 04ක් | ගොවිජනසේවා ප්‍රාදේශීය සංවර්ධන නිලධාරීතුමා-ඒ පිළිබඳ ලිඛිතව දැනුම්දෙන ලෙස දන්වන ලදී.<br><br>ඉංජිනේරු සහකාරතුමිය-යන්ත්‍රය ලබාගැනීමට ඉංජිනේරුතුමාට ලිපියක් ඉදිරිපත් කරන ලෙස |

| | | |
|---|---|---|
| | පමණක් ලැබුණු බවත් දන්වන ලදී. | දන්වන ලදී. |
| | | |

09. <u>**ලිපි ඉදිරිපත් කිරීම:-**</u>

**9/01.** වම් ඉවුර යාය 1-2 උඩයට පාලගම බෙදුම් ඇල ගොවි සංවිධානයට අයත් කුඩා වැව් දෙකෙහිම සොරොව් මුල වැලි එකතු වී ඇති බැවින් ඒවා ඉවත් කිරීමට බාහිර ආයතනයකට භාරදී රොන්මඩ ඉවත් කිරීමට අවසර ඉල්ලා තිබුණි.

වම් ඉවුර ඩී 4 ට්‍රැක් 7 තම්බුව බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා විසින්, පාලගම වැව් දෙක තවත් ගැඹුරු කරන විට අගාවතට ජලය රැගෙන යාමට තවත් වැඩියෙන් දින ගත්වන බැවින් එයට අගාවතේ ගොවි සංවිධානවල අදහස් අනිවාර්යයෙන්ම සලකා බැලිය යුතු බව දන්වා සිටින ලදී.

වම් ඉවුර යාය 1-2 උඩයට පාලගම බෙදුම් ඇල ගොවි සංවිධානයේ හිටපු සභාපති ආර්.ඒ.චන්ද්‍රසේකර මහතා අදහස් දක්වමින්, වැව් දෙකෙහිම ඇලවල් මුල වැලි කඳු එකතු වී ඇති බවත්, ඒවා ඉවත් කිරීම අත්‍යාවශ්‍යම කටයුත්තක් වන බවත් පවසන ලදී. අතීතයේ වාරි තාක්ෂණයේ දී වැව්වල සොරොව් මුල පස් තැන්පත් වීම වැලැක්වීමට බැම්මක් ඉදිකර තිබූ බවත්, එම බැම්ම නූතනයේ ඉදිකරන වැව්වල නොමැති වීම හේතුවෙන් මෙසේ පස් තැන්පත් වන බවත් පවසන ලදී.

ව්‍යාපාරයේ පොඩි වැව් සියල්ලේම වුවත් පස් ඉවත් කිරීම ඉල්ලා සිටියහොත්, ඊට අවසර දෙනවානම්, අගාවතේ ගොවි සංවිධානලට ජලය යාමට ගතවන දින ගණන සලකා බැලිය යුතු වන බවත්, ඒ හේතුවෙන් වැව් හැරීමේ කටයුත්තට විරුද්ධ වන බව වම් ඉවුර ඩී 7 දාගම බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු භාණ්ඩාගාරික තුමා විසින් දන්වා සිටින ලදී.

වම් ඉවුර යාය 1-2 උඩයට පාලගම බෙදුම්ඇල ගොවි සංවිධානයේ ඉල්ලීම පරිදි එම ගොවි සංවිධානයට අයත් වැවැ දෙකෙහි සොරොව් මුල පස් තැන්පත් වී ඇති ප්‍රදේශයන් හි පමණක් පස් ඉවත් කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැඩ අධීක්ෂණය යටතේ පමණක් සිදුකිරීම සුදුසු බව වම් ඉවුර ඩී 6 වදුරුස්ස බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු සභාපති තමා විසින් යෝජනා කරන ලදී. එම යෝජනාව වම් ඉවුර ඩී 4 ට්‍රැක් 7 තම්බුව බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**9/02.** වම් ඉවුර යාය 5 කුලංකට්ටිය අලුත්වැව ගොවි සංවිධාන බලප්‍රදේශයේ එම්.ඩී.එම්.එස්.බී.දිසානායක යන අය පවත්වාගෙන යන අංක AL//KU/453/LR/4 දරන වැලි

මංකඩෙහි බලපත්‍රය යාවත්කාලීන කරගැනීම සඳහා ව්‍යාපාරකමිටුවේ අවසරය ලබාදෙන ලෙස ඉල්ලීමක් කර තිබුණි.

වාරිමාර්ග සහකාර ඉංජිනේරුතුමිය දන්වා සිටියේ මෙම වැලි කැනීම් බලපත්‍ර හේතුවෙන් විවිධ පාර්ශවයන්ගෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දෝශදර්ශනයට ලක්වී ඇති බවත් 2008 දී වැලි කැනීම් බලපත්‍ර නිකුත් කිරීමට ව්‍යාපාර කමිටුවේ අවසරය ලබාගෙන ඇති බවත්, ඉන් පසු එම ක්‍රමය ඉවත් වී ගොස් ඇති බවත්, ඒ හේතුවෙන් වර්තමානයේ වැලි කැණීම සම්බන්ධව විශාල ගැටළුවක් පැණනැගී ඇති බැවින්, ව්‍යාපාර කමිටුවේ සාකච්ඡා කර තීරණයක් ගතයුතු බව පවසන ලදී. ව්‍යාපාර කමිටුවේ ඒකමතික තීරණයෙන් වැලි කැණීම් බලපත්‍ර අලුත් කිරීම සඳහා ව්‍යාපාර කමිටුවේ අවසරය ලබාදීම ප්‍රතික්ෂේප කරන ලදී.

9/03. හක්වටුනාඔය ප්‍රධාන ජලාශයට ඉස්මත්තේ දුම්මීය කටුපත්තෑය ගමේ ඇල හරහා පාලමක් ඉදිකරගැනීමට ව්‍යාපාර කමිටුවේ අනුමැතිය ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර තිබුණි. එම ස්ථානය පිළිබඳව ව්‍යාපාර කමිටුවේ සාමාජිකයින් නොදැන සිටීම හේතුවෙන් ස්ථානය පිළිබඳව සොයාබලා තීරණයක් දියයුතු බව වාරිමාරග ඉංජිනේරු සහකාරතුමිය විසින් පවසා සිටින ලදී.

9/04 වම් ඉවුර දෙමටගොල්ල ගොවි සංවිධානයට අයත් දාගම වෙල්ලෙන් කරුවල ගහ මුල හේන කුඹුරට ජලය ලබාගැනීමට කුඹුරු බටයක් ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

9/05 වම් ඉවුර දෙමටගොල්ල ගොවි සංවිධානයට අයත් දාගම වෙල්ලෙන් කෝන්ගහමුල වල යන ස්ථානයෙන් කුඹුරට ජලය ලබාගැනීමට කුඹුරු බටයක් ඉල්ලා ලිපියක් ඉදිරිපත් කර තිබුණි.

වම් ඉවුර ප්‍රධාන ඇලෙන් කුඹුරු බට යෙදීමට අගාවතේ ගොවි සංවිධාවල විරුද්ධතාවයක් ඇති බව වම් ඉවුර ඩී 6 වදුරුස්ස බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු සභාපති තුමාගේ විරුද්ධත්වය ප්‍රකාෂ කරන ලදී. වාරිමාර්ග ඉංජිනේරු සහකාරතුමිය මෙම ස්ථානය පිළිබඳව සොයාබලා අවශ්‍ය විසඳුම් ලබාදෙන බව දන්වා සිටින ලදී.

**10. <u>යෝජනා/ අදහස් ඉදිරිපත් කිරීම:-</u>**

- ව.ඉ.යාය 4-5 ඩී 3 අගාර කටුගම්පල බෙ.ගොවි සං.- ගරු ලේකම් තුමාගේ යෝජනාව වූයේ ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානයේ නිලවරණ මහසභා රැස්වීමේදී අප ව්‍යාපාරයෙන් සහභාගී වූ කුරුණෑගල දිස්ත්‍රික් ඒකාබදධ ගොවි සංවිධානයේ ගරු ලේකම්, හක්වටුනාඔය ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපති, දකුණු ඉවුර යාය 3 ඩී 8 සියඹලාවැව බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු සභාපති වූ ආර්. එම්. දිසානායක මහතාව

ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානයේ මාධ්‍ය ප්‍රචාරක ලේකම් ධුරයට තෝරා.
පත්කරගැනීම හක්වටුනාඔය ගොවි ජනතාවම ලැබූ විශිෂ්ට ජයග්‍රහනයක් වීම හේතුවෙන් එතුමන්ට සුභපතා දැන්වීම් කිහිපයක් ඒකාබද්ධ ගොවි සංවිධානයේ අරමුදලින් මුද්‍රණය කර ප්‍රදර්ශනය කිරීමට හක්වටුනාඔය ඒකාබද්ධ ගොවි සංවිධානය ලෙස කටයුතු කිරීම සුදුසු බවයි. එම යෝජනාව වම් ඉවුර යාය 1-2 උඩයට පාලගම බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- ඒකාබද්ධ ගොවි සංවිධානයේ ගරු සභාපතිතුමා විසින් විශේෂ කතාවක් පවත්වා තමාව එම උසස් තනතුරට පත්කිරිමට අවශ්‍ය පන්නරය ලබාදුන් හක්වටුනාඔය ව්‍යාපාරයේ සියළුම අදාල නිලධාරීන්, ගොවි නියෝජිතයන් සහ ගොවී ප්‍රජාවට තමා ස්තූතිවන්ත වන බවත්, එම තනතුරෙන් මෙම ව්‍යාපාරයට ගතහැකි උපරිම වාසි අත්කරගැනීමට ඉදිරියට කටයුතු සිදුකරමු යන්නත් පවසන ලදී. වසවිසෙන් තොර ආහාර නිෂ්පාදනය කොට ඒවා අලෙවි කිරීමට සුදුසු ස්ථානයක කඩයක් ඉදිකරගැනීම තමාගේ ඉදිරි බලාපොරොත්තුවක් බවත් පවසන ලදී.

## 11. <u>පෙර කන්න රැස්වීමේ වගා තීන්දු තීරණ ඉදිරිපත් කිරීම</u>

1994 අංක 13 දරණ වාරිමාර්ග පනතින් (සංශෝධිත) 1969 අංක 48 දරණ වාරිමාර්ග අඥාපනතේ විධිවිධාන අනුව 2017/09/21 දින හක්වටුනාඔය නේවාසික ව්‍යාපාර කළමණාකරන කාර්යාලයේදී හක්වටුනාඔය මහා වාරි ව්‍යාපාරයේ 2017/2018 මහ කන්නය සඳහා යෝජිත වගා කාල සටහන.

| අනු අංකය | කාරණය | තීන්දුව |
|---|---|---|
| 1. | වගා කරනු ලබන බිම් ප්‍රමාණය | අක්කර 6371 |
| 2. | වගා කරනු ලබන බෝගය | මාස 3 , 3 ½ වී සහ වෙනත් බෝග |
| 3. | වගාව ආරම්භ කිරීම | වර්ෂා ජලයෙන් |
| 4. | ඇළ වේළි ශුද්ධ කිරීම<br>ප්‍රධාන ඇළ (වාරිමාර්ග දෙපා: මගින්)<br>බෙදුම් ඇළ (ගොවි සංවිධානය මගින්) කෙත් ඇළ (ගොවීන් විසින්) | 2017/10/15 ට පෙර<br>2017/10/10 ට පෙර<br>2017/10/10 ට පෙර |
| 5. | ශුද්ධ නොකරන ලද ඇළවේළි ශුද්ධ කිරීම | 2017/10/15 ට පෙර<br>(ගොවි සංවිධාන අරමුදල් යොදා) |
| 6. | වගා කටයුතු ආරම්භ කිරීම | 2017/10/15 සිට |
| 7. | වගාව පිහිටුවා අවසන් කිරීම | 2017/11/05 ට පෙර |
| 8. | මුර ජලය නිකුත් කිරීම | 2017/11/07 |
| 9. | වගාව සඳහා ජලය නිකුත් කිරීම අවසන් කිරීම | 2018/02/07 |
| 10. | වගා රක්ෂණය අවසන් කළ යුතු දිනය | 2017/11/05 දක්වා |

| | | |
|---|---|---|
| 11. | වගා හානි දැනුම් දිය යුතු අවසන් දිනය | හානී වී දින14 ක් ඇතුළත |
| 12. | අස්වනු නෙළා අවසන් කළයුතු දිනය | 2018/03/05 |

විශේෂ කරුණු:-2017/10/15 දින වනවිට වර්ෂා ජලයෙන් වගාව ආරම්භ කර, සම්පූර්ණ වගාබිම් ප්‍රමාණයෙන් 50% ක් වගා කිරීමේ කටයුතු ආරම්භ කිරීම සහ ප්‍රධාන ජලාශයේ ජල මට්ටම අඩි 15 ඉක්මවීම වූ පසු ප්‍රධාන ජලාශයෙන් ජලය නිකුත් කිරීමට තීරණය කරන ලදී.

1994 අංක 13 දරණ (සංශෝධිත) වාරිමාර්ග අඥාපනතේ II වන උප වගන්තිය අනුව ඉදිරි කන්නයේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත නීති රීති.

1. කෙත් ඇළ සහ බෙදුම් ඇළ නඩත්තුව සඳහා අක්කරයකට රු.300.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

2. නියමිත දිනට බෙදුම් ඇළ සහ කෙත් ඇළෙහි තම කොටස නඩත්තු නොකරන ගොවීන්ගෙන් බඹයකට රු.200.00 ක මුදලක් ගොවි සංවිධානයට ගෙවිය යුතුය.

3. ගවයන් වගා බිම් වලට අනවසරයෙන් ඇතුළත් කිරීම හා වගා පාලු කිරීමේ දඩය ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව.

ඉහත 2017/2018 මහ කන්නය සඳහා පෙර කන්න රැස්වීමේ දී ගන්නා ලද තීන්දු තීරණ හා නීති රීති සුදුසු බවට වම් ඉවුර ඩී 4 ට්‍රැක් 07 තම්බුව බෙදුම් ඇළ ගොවි සංවිධානයේ ගරු සභාපති ආර්. ඩී. ගුණතිලක මහතා විසින් යෝජනා කරන ලද අතර, දකුණු ඉවුර යාය 6 බෙදුම්ඇල ගොවි සංවිධානයේ ගරු සභාපති එච්.එම් මුදියන්සේ මහතා විසින් එය ස්ථිර කරන ලදි.

13. ස්තුති කිරීම:-

2017/2018 මහ කන්න රැස්වීමට සහභාගී වූ සියළුම රාජ්‍ය නිලධාරීන්ට සහ ගොවි සංවිධාන නියෝජිත මහත්ම මහත්මීන්ට රැස්වීමට සහභාගීවීම වෙනුවෙන් නේවාසික ව්‍යාපාර කළමණාකාර මහතාගේ ස්තුතිය පිරිනැමීමෙන් අනතුරුව සභාවේ වැඩකටයුතු අවසන් කරන ලදී.

.......................................,

ඩබ්.එම්.ඩී. ගාමිණී කුසුම් ශ්‍රියානන්ද,
නේවාසික ව්‍යාපාර කළමණාකරු,
හක්වටුනාඔය ව්‍යාපාරය.

ගරු ලේකම්,
ව්‍යාපාර කළමනාකරණ කමිටුව.

පිටපත්:-.

1. අධ්‍යක්ෂතුමිය - වරිමාර්ග කළමණාකරන අංශය-කොළඹ (කා.දැ.පි)
2. නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස්තුමිය-කුරුණෑගල(කා.දැ.පි)
3. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ-කුරුණෑගල (කා.දැ.පි)
4. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්-කුරුණෑගල (කා.දැ.පි.)
5. කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකුමිය - කුරුණෑගල (කා.දැ.පි)
6. ප්‍රාදේශීය ලේකම්- පොල්පිතිගම (කා.දැ.පි)
7. සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ-ගල්ගමුව (කා.දැ.පි)
8. දිස්ත්‍රික් කළමණාකරු -පොහොර ලේකම් කාර්යාලය (කා.දැ.පි)
9. වාරිමාර්ග ඉන්ජිනේරුතුමා - ඉබ්බාගමුව (කා.දැ.පි)
10. ගොවිජන සේවා ප්‍රාදේශීය සංවර්ධන නිළධාරීතුමා-රඹෑ (කා.දැ.පි)
11. සහකාර අධ්‍යක්ෂ-කෘෂිරක්ෂණ මණ්ඩලය- කුරුණෑගල (කා.දැ.පි)
12. මුලස්ථාන කෘෂිකර්ම උපදේශකතුමා- රඹෑ (කා.දැ.පි)
13. ජනපද නිලධාරීතුමා - පොල්පිතිගම (කා.දැ.පි)
14. පරිපාලන ග්‍රාමනිලධාරීතුමා - පොල්පිතිගම (කා.දැ.පි)
15. සියලුම අදාල වසම්වල කෘෂි පර්යේෂණ හා නිෂ්පාදන සහකාර මහත්ම මහත්මීන් (කා.දැ.පි)
16. සියලුම ගොවි සංවිධාන නිළධාරී මහත්ම මහත්මීන්-හක්වටුනාඔය ව්‍යාපාරය (කා.දැ.පි)

නේවාසික ව්‍යා.කළමනාකරු
KPM } 072-4569418
ෆැක්ස්
Fax }
ඊ මෙල්
E-mail }